www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# මාධ්‍යයන් යුද්ධයේ ක්‍රියා පිලිවෙත ගෙන යා යුතු බවට ශ්‍රී ලංකා ජනාධිපති අන කරයි

## Sri Lankan president demands media toes the line on the war

**කේ. රත්නායක විසිනි**
**2006 අගෝස්තු 19**

"රටෙහි වත්මන් තත්වය" පිලිබඳව ව්‍යාජ අයුරින් විස්තර කිරීම සඳහා කර්තෘවරුන් සහ ප්‍රචාරක ආයතනවල ප්‍රධානීන් සමග ශ්‍රී ලංකා ජනාධිපති මහින්ද රාජපක්ෂ පසු ගිය බදාදා රැස්වීමක් පැවැත්වී ය. රැස්වීමේ යථා වුවමනාව වූයේ දෙමල ඊලම් විමුක්ති කොටි සංවිධානයට එරෙහි ව පුලුල් කෙරෙන යුද්ධය පිලිබඳ ආන්ඩුවේ ප්‍රචාරනය විශ්වාසදායක ලෙස පැතිරවීමට එක් රැස් වූවන් හට පීඩනය යෙදීමයි.

රැස්වීම කැඳවීම මගින් ම එලිදරව් කෙරුනේ නිශ්චිත නුරුස්නා බාවයකි. ලංකාවේ මාධ්‍යයන් දැනට මත් මෙම පිලිවෙත පවත්වා ගෙන යයි. යුද්ධය පිලිබඳ සෑම වාර්තාවක් ම පාහේ ආන්ඩුවේ ප්‍රකාශ හා මිලිටරි ප්‍රකාශන මත සෘජුව ම පදනම් වූ ඒවා ය. යුද්ධ ප්‍රදේශ පිලිබඳ කෙරෙන මුල් පෙලේ යථා වාර්තා ඉතා මඳ වසයෙන් පල වන අතර  කතුවැකි හා ප්‍රකාශනවල යුද්ධයට විරුද්ධත්වයක් නොපවතී.

එසේ වුවද මිලිටරි දුෂ්ටත්වයන් හා සිවිල් වැසියන්ට එරෙහි වන විනාශයකින් තොර ප්‍රහාර පිලිබඳ වාර්තා නොවැලැක්විය හැකි අයුරින් කොලඹ හා ජාත්‍යන්තර මාධ්‍ය වෙත රූටා යමින් පවතින්නේ සරලවම විමුක්ති කොටි සංවිධානයට හිතවාදී වාර්තා මගින් නොව ශ්‍රී ලංකා සටන් විරාම නිරීක්ෂන කමිටුව හා නොයෙකුත් රාජ්‍ය නොවන සංවිධානයන් හරහා ය. මෙහි ප්‍රතිඵලයක් ලෙස මිලිටරි කව තුල ප්‍රචාරක යුද්ධයෙන් පරාජයට පත්වීම පිලිබඳ සැලකිල්ල යොමුව ඇති අතර "විමුක්ති කොටි සාවද්‍ය තොරතුරු" පැතිරීම වැලැක්විය යුතු බව සඳහන් කෙරෙයි.

විය යුතු පරිදි ම, රාජපක්ෂ සිය රැස්වීම ආරම්භ කලේ බොරුවකිනි. මිලිටරිය තනිකරව ම යෙදී සිටින්නේ ආරක්ෂක ක්‍රියා දාමයක යැයි ඔහු අවධාරනය කාල් ය. "යුද්ධයක් ඇත්තේ නැතැ"යි කී ඔහු "අපගේ ස්ථානයන් ආරක්ෂා කර ගැනීමේ ජාතික අවශ්‍යතාවය උදෙසා හමුදාවන් ප්‍රතිප්‍රහාර එල්ල කරනවා පමනකැ"යි පැවසී ය. පවතින්නේ යුද්ධයක් නම්, රජයේ හමුදාවන් "සටන් කරමින් ඉදිරියට යනු ඇත"යි ඔහු කියා සිටියේ ය.

හමුදාව දැනට මත් සටන් කර ඉදිරියට යාමට උත්සාහ දරා තිබේ. විමුක්ති කොටි සංවිධානයට එරෙහිව රාජපක්ෂ විසින් මිලිටරි ක්‍රියාවන් ආරම්භ කලේ ජුලි 26 වෙනි දා ය. 2002 සටන් විරාම ගිවිසුම විවෘතව උල්ලංඝනය කරමින් මාවිල් ආරු වාරි මාර්ග ජල දොරටු පවරා ගන්නා ලෙස ඔහු මිලිටරියට අන කලේ ය. මෙහෙයුම "සීමාසහිත" හා "මානුෂික"  එකක් බවට ජනාධිපති කියා සිටින අතර වාරයේ දී අනෙකුත් ප්‍රදේශවල විමුක්ති කොටි ඉලක්කයන් වෙත ගුවන් හමුදාව බෝම්බ හෙලූ අතර වාරි මාර්ග ජල දොරටු විවෘත කර පහලින් ජීවත් වන ගොවි ජනතාවට ජලය සැපයීමෙන් අනතුරුව ද යුද්ධය ක්‍රියාත්මක විය.

රාජපක්ෂගේ "ජලය සඳහා යුද්ධය", විමුක්ති කොටි සංවිධානය දුර්වල වී ඇතැයි මිලිටරිය විසින් ගනන් බැලුනු නැගෙනහිර ප්‍රදේශ අල්ලා ගැනීම සඳහා පුලුල් යුද්ධයක් ඇති කිරීමට යොදා ගත් සරල පූර්වෝක්තියකි. නොවැලැක්විය හැකි ලෙස ම සටන් අනෙකුත් ප්‍රදේශවලට ද පැතිරිනිඃ මිලිටරිය කොතැනකවත් " ඉදිරියට ගමන් කරන්නේ නැති නම්" ඒ අන් කිසිවක් නිසා නොව විමුක්ති කොටි සංවිධානය යාපනයේ අර්ධද්වීපයේ තම ආරක්ෂක පවුරු සකසා ගැනීම නිසා ඊට සැලකිය යුතු ලෙස බාධා පැමින තිබීම නිසා ය. පසු ගිය සතියේ සටන්වලින් සොල්දාදුවන් 106ක් මරනයට පත් වූ බව රාජපක්ෂගේ රැස්වීමෙන් දිනකට පසුව මිලිටරිය පිලිගත්තේ ය. සටන්කරුවන් පලවා හැරීමේ එල්ලය සහිතව මිලිටරි යුද ගුවන් යානා යලි යලිත් එල්ටීටීඊ ස්ථානයන්ට බෝම්බ වරුසාවන් එල්ල කලේ ය. එක්සත් ජාතීන්ගේ වාර්තාවන්ට අනුව දිවයිනෙහි උතුරේ 41,000ක් ඇතුලුව සිවිල් වැසියන් 150,000ක් සරනාගතයින් බවට පත්ව ඇත.

"යුද්ධයක් නැතැ"යි කියා සිටීම හාස්‍යජනක ය. මිලිටරිය යෙදී සිටින්නේ සරල ආරක්ෂක ක්‍රියා දාමයක බව ප්‍රකාශයට පත් කිරීම දිවයින යලි යුද්ධයකට තල්ලු කිරීම පිලිබඳ ආන්ඩුවේ වගකීම අකාමකා දැමීම සඳහා ගොතන ලද්දකි. "සාකච්ඡා සඳහා විවෘත" සාමයේ මිනිසා ලෙස රාජපක්ෂගේ පෙනී සිටීම කුහකත්වයේ හා නින්දාශීලිත්වයේ දුමාරයකි. එසේ වුවද

ජනාධිපතිගේ වචන ගෞරවාන්විතව පුනරුච්ඡාරනය කිරීම හැරුන විට කිසියම්ම හෝ විවේචනශීලී ඉදිරිපත් කිරීමක් කිසිම මාධ්‍යයක පසු දින තුල දැක ගත නොහැකි විය.

ආන්ඩුවේ යුද පිලිවෙත පැහැදිලි කිරීමෙන් පසුව රැස්ව සිටි මාධ්‍ය නියෝජිතයින් හට වඩාත් වගකීමෙන් යුතුව ක්‍රියා කරන ලෙස රාජපක්ෂ කියා සිටියේ ය. " මම නිරතුරුව ම මාධ්‍යයේ මිත්‍රයෙකුව සිටි අතර විෂයානුබද්ධ විවේචනය අගය කලෙමි" යැයි පැවසූ ඔහු "එහෙත් ජාතික හා මහජන ආරක්ෂාවට තර්ජනය කෙරෙන වගකීම් රහිත මාධ්‍යවේදයට මම සමාව නොදෙන්නෙමි" යැයි කියා සිටියේ ය. කප්පාදු කිරීමට තමන් අකැමැති බව පැවසූ ඔහු මාධ්‍යයන් තමන් විසින් ම එයට සංවරයක් ඇති කර ගත යුතු යැයි කියා සිටියේ ය. පවතින හදිසි නීතිය යටතේ මාධ්‍ය කප්පාදුවක් පැනවීමට රාජපක්ෂ හට අසීමිත බලයක් ඇත.

රාජපක්ෂ කියා සිටි අයුරින් "මාධ්‍ය පිලිබඳව තද බල ක්‍රියා මාර්ගයක් ගැනීම සඳහා" ආන්ඩුවට දැනට මත් තදින් බල කෙරෙමින් පවතියි. පෙර සිටි ජනාධිපතිවරුන් තද බල කප්පාදු ක්‍රියාත්මක කල බව ජනතාව තමන්ට මතක් කර දෙන්නේ යැයි ඔහු කියා සිටියේ ය.

විමුක්ති කොටි සංවිධානයට "නොදිය යුතු තරමේ ප්‍රසිද්ධියක්" ලබා දීමට මාධ්‍යයේ අංශයන් ක්‍රියාත්මක වන බවට හමුදාවේ ඉහල ජෙනරාල්වරුන් කිහිප දෙනෙකු ජාතික ආරක්ෂක කවුන්සිල රැස්වීමේ දී චෝදනා කල බව මෑත දී පුවත්පත්වල වාර්තා විනි. වගකිවයුත්තන් වහා ම රැස් කල ජනාධිපති ඔවුන්ගේ වාර්තාකරනයන් සීමා කරවීමට පියවර ගත්තේ ය.

වගකිවයුතු වාර්තාකරනය යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද යන්න සඳහා නිදසුනක් ආරක්ෂක අමාත්‍යංශයේ නිල වෙබ් අඩවියෙන් දැක ගතහැකි ය. එල්ටීටීඊයට අයත් මුලතිව් දිස්ත්‍රික්කයේ කලින් අනාත නිවාසයක්ව පැවති ස්ථානයකට ගුවන් හමුදාව විසින් බෝම්බ ප්‍රහාරයක් එල්ල කිරීම නිසා, එල්ටීටීඊයට අනුව දින දෙකක පුහුනු පාඨමාලාවක් හදාරමින් සිටි පාසැල් ලමයින් 61ක් මරනයට පත් විය. සටන් විරාම නිරීක්ෂන කමිටු නිලධාරින් හා එක්සත් ජාතීන්ගේ ලමා අරමුදලෙහි (යුනිසෙෆ්) නියෝජිතයින් එම ස්ථානයට ගොස් ප්‍රධාන වසයෙන් ප්‍රහාරයට ගොදුරුව ඇත්තේ යොවුන්වියේ පසුවන බාලිකාවන් බව තහවුරු කලහ. මිලිටරි උපකරන හෝ පුහුනුව පිලිබඳ කිසිම සාක්ෂියක් හමුව නොතිබිනි.

එසේ වුවද ආන්ඩුව හා මිලිටරිය දිගින් දිගටම අවධාරනය කලේ ඔවුන් එල්ටීටීඊ පුහුනු කඳවුරකට බෝම්බ එල්ල කල බවත් මරනයට පත්ව ඇත්තේ " ලමා සොල්දාදුවන්" බවත් ය. එහි වෙබ් අඩවියේ මිලිටරිය විසින් නිකුත් කල "තදින්ම වර්ගීකරනයට ලක් වූ වීඩියෝව" මගින් කියා සිටින්නේ මිලිටරි සාමාජිකාවන් නිල ඇඳුමින් සැරසී පුහුනුවීම්වල යෙදීම, ආවරනය කරන ලද (කැමෆ්ලාජ්) හා අනෙකුත් වාහන ඉක්මනින් ඇතුලට පැමිනීම හා විශාල සාකච්ඡාවෙන් තුවාල ලැබූ සාමාජිකයන් රැගෙන පිටව යාම මෙහි ඉතා පැහැදිලිව පෙන්වන බවයි." අඳුරු හා නොපැහැදිලි වීඩියෝ පටය නරඹන ඕනෑ ම කෙනෙකුට ඒත්තු යන පරිදි මෙම ප්‍රකාශය නරුම එකකි. නිරීක්ෂන කමිටුවේ ප්‍රධානී උල්ෆ් හෙන්රික්සන් විනීත ලෙස ප්‍රකාශ කල පරිදි "අප නැරඹූ වීඩියෝ පින්තූර අසම්පූර්න ය."

එසේ වුවද තව මත් මිලිටරිය මෙම පාපිෂ්ට ක්‍රියාව ප්‍රතික්ෂේප කරන අතර ගුවන් ප්‍රහාරයේ දී එල්ටීටීඊ සාමාජිකයින් 800ක් මරනයට පත් වූ බව පවසයි. වෙබ් අඩවි ප්‍රකාශයේ තිබෙන එක් සුවිශේෂී දුෂ්ට එල්ලයක් නම් එහි බොරුකාර බව ප්‍රතික්ෂේප කරන්නට දරන සියලු උත්සාහයන් "එල්ටීටීඊ හිතවාදී ප්‍රචාරකයින්ගේ සාවද්‍ය ප්‍රකාශ" ලෙස ගුනාංගීකරනය කිරීම යි. ප්‍රකාශය ඍජුව ම එල්ල නොකලා වුවත් අඟවා සිටින ආකාරයට නිරීක්ෂන කමිටුව, යුනිසෙෆ් හා එක්සත් ජාතීන්ගේ සංවිධානය වැනි ආයතනවලින් ඉදිරිපත් කෙරෙන සාක්ෂ්‍යවලට ද මෙම චෝදනාව එල්ල වේ. මිලිටරිය සම්බන්ධයෙන් සැලකුවිට එහි ප්‍රචාරයන් දෙස විවේචනශීලි ලෙස බලන යමෙකු වෙතොත් ඔහු සිටින්නේ සතුරාගේ කඳවුරෙහි ය.

මිලිටරිය හා නොයෙකුත් ප්‍රති-එල්ටීටීඊ සන්නද්ධ කන්ඩායම් හා සිංහල අන්තවාදී කන්ඩායම් අතර සිටින එහි සගයින්, වාචික තර්ජනයන්ට පමනක් සීමා නොවන අතර තදබල කප්පාදු පැනවිය යුතු බව අවධාරනය කරයි. විශේෂයෙන් දෙමල මුද්‍රිත මාධ්‍යයෙන් පල වන ප්‍රකාශන වෙත ශාරීරික ප්‍රහාරයන් එල්ල කිරීම උත්සන්න කෙරී ඇත.

දෙමල දිනපතා පුවත්පතක් වන උදයන් හි බෙදාහරින්නෙකු වූ සතාසිවම් බාස්කරන් තද බල ඇඳිරි නීතිය ඉවත් කල පැයක කාලය තුල දී, යාපනය නගරයේ පුවත් පත බෙදා හරිමින් සිටිය දී, වෙඩි තබා ඝාතනය කෙරිනි. මෙම වසර තුල ඝාතනය කෙරුනු හතර වන උදයන් සේවකයා ඔහු වේ. එදින ම උදයන් පුවත්පතේ සහෝදර පුවත් පතක් වන සුදර් ඔලි පුවත් පතෙහි කොලඹ කාර්යාලයක් මිලිටරිය විසින් පරීක්ෂා කෙරිනි.

මුද්‍රිත මාධ්‍ය නිදහසට එල්ල වන මෙම ප්‍රහාරයන් පිලිබඳව රාජපක්ෂ හා මාධ්‍ය නියෝජිතයන් අතර පැවති රැස්වීමේ දී සාකච්ඡා වූ බවට ලකුනක් වත් නොමැත. රැස්වීමෙන් පසුව මාධ්‍යය තුල කිසි ම විවේචනශීලි ප්‍රකාශයක් හෝ නොමැති වීම මගින් පැහැදිලි වන්නේ කිසිවකු සාකච්ඡා කල ක්‍රියා මාර්ගයෙන් ඉවතට යාමට අදහස් නොකරන බවයි.

© www.wsws.org